(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 73.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2021 මැයි 04 අඟහරුවාදා පූ. භා. 10.00 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹෑපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඞ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, හා ළූණු අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ටිරාන් අලස් මහතා**

ගරු **නසීර් අහමඩ් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **සාගර කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **උදයන කිරිඳිගොඩ මහතා**

ගරු **ජගත් කුමාර මහතා**

ගරු **ගෙවිඳු කුමාරතුංග මහතා**

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන : කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන)' නැමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ද පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ බහුතරයක් විසින් සම්මත කළ හැකි බව ද ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

II

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රන්ජන් රාමනායක මහතාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීම හේතුවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127(3) හි විධිවිධාන ප්‍රකාරව, 2021 අප්‍රේල් 30 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම : (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2020 අංක 7 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2021.03.01 සිට 2021.03.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ "පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය" මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන; සහ

(ii) රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10(අ) වගන්තිය යටතේ ආනයන භාණ්ඩ සම්බන්ධ වරණීය හා සාමාන්‍ය තීරු බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 01 දිනැති අංක 2213/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය

පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය , **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 21 දිනැති අංක 2202/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 14 දිනැති අංක 2206/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 16 දිනැති අංක 2206/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 13 දිනැති අංක 2210/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 18 දිනැති අංක 2211/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 11 දිනැති අංක 2214/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 6(2) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක 2214/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(x) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 05 දිනැති අංක 2217/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 23 දිනැති අංක 2220/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(xii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අප්‍රේල් 07 දිනැති අංක 2222/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

පිළිගන්වා එම නියමයන් සහ නියෝග, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(4) කම්කරු අමාත්‍යවරයා විසින්—

(i) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2017 වර්ෂයේ පැවති 106 වැනි සැසිවාරයේ දී පිළිගනු ලැබූ නිර්දේශය;

(ii) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2019 වර්ෂයේ පැවති 108 වැනි සැසිවාරයේ දී පිළිගනු ලැබූ නිර්දේශය; සහ

(iii) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2019 වර්ෂයේ පැවති 108 වැනි සැසිවාරයේ දී පිළිගනු ලැබූ සම්මුතිය

පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා ව්‍යවසායකත්ව, අලෙවිකරණ, මානව සම්පත් කළමනාකරණ, ව්‍යාපාර කළමනාකරණ, ගිණුම්කරණ සහ මූල්‍ය අධ්‍යනාංශ පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) ධීවර අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත කරන ලදී.

(8) පරිසර අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත කරන ලදී.

3. කාරක සභා වාර්තා පිළිගැන්වීම: රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) ජනාධිපතිවරයාගේ අරමුදල පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2018;

(iii) 2004 අංක 11 දරන මුදල් පනත යටතේ රෙගුලාසි;

(iv) 2018 අංක 35 දරන මුදල් පනත යටතේ නියෝගය; සහ

(v) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

4. මහජන පෙත්සම් පිළිගැන්වීම:

(1) රන්න, තිස්ස පාර, කහදාව, අංක 129 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ජේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2021.03.09 දිනැති පෙත්සම ගරු මහින්ද අමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මැදවච්චිය, රෝහල ඉදිරිපිට පාර, අංක 131/බී දරන ස්ථානයෙහි පදිංචි එච්. එම්. කේ. දිසානායක මහතාගෙන් ලැබුණු 2020.12.20 දිනැති පෙත්සම ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මහනුවර, මුල්ගම්පොල, හීරුස්සගල, දෙවන පටුමග, අංක 71/35/1 දරන ස්ථානයෙහි පදිංචි එන්. කේ. සූරියබණ්ඩාර මහතාගෙන් ලැබුණු 2020.11.29 දිනැති පෙත්සම ගරු එස්. බී. දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) පන්නිපිටිය, ඇරැව්වල, රත්න මාවත, අංක 545/1බී දරන ස්ථානයෙහි පදිංචි සී. අබේවික්‍රම මහතාගෙන් ලැබුණු 2021.02.24 දිනැති පෙත්සම; සහ

(ii) මාතර, නාවිමන උතුර, සෝමාරාම පාර, අදිරප්පලයි වත්ත යන ලිපිනයෙහි පදිංචි පී. ඒ. චන්ද්‍රාවතී මහත්මියගෙන් ලැබුණු 2021.01.16 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) රිදීගම, කටුපිලගොල්ල, "සිරි නිවස" යන ලිපිනයෙහි පදිංචි පී. ජී. සිරිල් ගුණරත්න මහතාගෙන් ලැබුණු 2021.02.08 දිනැති පෙත්සම ගරු ශාන්ත බණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) කොළඹගේආර, හල්මිල්ලආර, 17 පාර, අංක 896/ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ. ඩබ්ලිව්. ගාමිණී කරුණානන්ද මහතාගෙන් ලැබුණු 2021.02.24 දිනැති පෙත්සම; සහ

(ii) කැලණිය, පිලපිටිය, ජයතිලක මාවත, අංක 112/2ඒ දරන ස්ථානයෙහි පදිංචි ආර්. ජේ. එච්. ජයසුන්දර මහතාගෙන් ලැබුණු 2021.02.21 දිනැති පෙත්සම

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(7) ගම්පහ, අකරවිට, අංක 201 දරන ස්ථානයෙහි පදිංචි කේ. විජය ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2021.01.26 දිනැති පෙත්සම ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) බණ්ඩාරගම, ගුංගමුව, ගුණානන්ද මාවත, අංක 123 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. කපිල මහතාගෙන් ලැබුණු 2021.03.01 දිනැති පෙත්සම ගරු අනුප පස්කුවල් මහතා විසින් පිළිගන්වන ලදී.

(9) (i) පේරාදෙණිය, උඩපේරාදෙණිය, අංක 8, "තුෂාරගිර" දරන ස්ථානයෙහි පදිංචි එම්. සිසිර විල්ෆ්‍රඩ් කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2021.03.04 දිනැති පෙත්සම; සහ

(ii) කිරිබත්කුඹුර, බුළුමුල්ල, අංක 185/බී දරන ස්ථානයෙහි පදිංචි ආර්. එච්. ඒ. එම්. ජේ. පී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2021.02.18 දිනැති පෙත්සම

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(10) ගම්පහ, විජය පාර, අංක 96/1 දරන ස්ථානයෙහි පදිංචි පද්මා මාලනී මහගමාරච්චි මහත්මියගෙන් ලැබුණු 2021.01.18 දිනැති පෙත්සම ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

5. පාර්ලිමේන්තුවේ රැස්වීම්: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. පූ.භා. 11.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය: වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 12 දිනැති අංක 2210/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22(1) වගන්තිය යටතේ බෝතල් කරන ලද රා සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 07 දිනැති අංක 2209/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.
(අංක 03/2021 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8. සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 07 දිනැති අංක 2209/44 දරන අති විශේෂ ගැසට් පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.
(අංක 04/2021 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 3): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 4 සහ 12 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 07 දිනැති අංක 2209/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.
(අංක 05/2021 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 4): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021

ජනවාරි 11 දිනැති අංක 2210/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 06/2021 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය ය"යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "අපනයනය කිරීම සිදුව ඇති බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 16 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "සැපයුම සිදුකරන ලද බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 19 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> ''(ආ) (iiආ) වන අනුඡේදයේ, ''ප්‍රති අපනයන කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් භාණ්ඩ;'' යන වචන වෙනුවට ''ප්‍රති අපනයන කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් භාණ්ඩ සඳහා වන ගෙවීම එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැබී ඇති එම භාණ්ඩ;'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''සේවා සැපයුම සිදු කරන ලද බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 26 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> ''(ඇ) (v) වන අනුඡේදයේ ''බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන'' යන වචන වෙනුවට ''එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;
>
> (ඉ) (vi) වන අනුඡේදයේ ''බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන'' යන වචන වෙනුවට ''අන්තර්ජාලය සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;
>
> (ඊ) (vii) වන අනුඡේදයේ ''විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් මාර්ගයෙන් ගෙවීම් ලැබෙන්නා වූ'' යන වචන වෙනුවට ''එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් තත්

කාර්ය සඳහා ගෙවීම් ලැබෙන්නා වූ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) (ඇ) වන අනුඡේදයේ ''විදේශීය ව්‍යවහාර මුදලින්, ශ්‍රී ලංකාවේ බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්,'' යන වචන වෙනුවට ''එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්,'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

''(3) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් වන ගාස්තුව අවස්ථාවෝචිත පරිදි, එම අපනයනය සිදු කරන ලද හෝ එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලකින් නොලැබීම නොතකා, එම භාණ්ඩ අපනයනය කරනු ලබන බවට හෝ එම සේවාවන් ඉටු කරනු ලබන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය එම භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 6 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(2) මේ වගන්තිය යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු -

(අ) ඔහුගේ බදු අයකළ හැකි සැපයුම් 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් බදු අයකළ හැකි සැපයුම්වල මුළු වටිනාකම ඉක්මවන්නේ නම් මිස; හෝ

(ආ) ඔහුගේ මුළු සැපයුම් අපනයනය කර තිබෙන බවට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන අපනයනකරුවකු වන්නේ නම් මිස; හෝ

(ඇ) සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ කාර්යය සඳහා කොමසාරිස්-ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවකු ලෙස එම යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වීමට කමැති තැනැත්තකු වන්නේ නම් මිස,

කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ ලියාපදිංචිවීමට සුදුසුකම් නොලැබිය යුතු ය.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 11 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(2) (6) වන උපවගන්තියේ (v) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්;

(vi) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් වන ගාස්තුව, අවස්ථාවෝචිත පරිදි, එම අපනයනය සිදු කරන ලද හෝ එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලකින් ලැබී නොමැති නම්.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 8වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ක) මේ (සංශෝධන) පනත ආරම්භ වන දින සිට ක්‍රියාත්මක වන''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය සහ 10 වැනි වගන්තිය සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

''ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය''යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, සංශෝධිතාකාරයෙන් ඊට අනුකූලව තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

12. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය ය''යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය ය''යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 5 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 28 වැනි පේළිය සහ 29 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''ලද ණය වෙනුවෙන් මූල්‍ය ආයතනය විසින් දරන ලද අරමුදල්වල පිරිවැය, ඒ මූල්‍ය ආයතනය විසින් ආදායම'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තියේ සිට 17 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

18 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"එසේ වුව ද, නිර්වාසික තැනැත්තකු විසින් 2021 අප්‍රේල් මස";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19 වැනි වගන්තියේ සිට 21 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

22 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ, "ද්විත්ව බදුකරණ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

23 වැනි වගන්තියේ සිට 39 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

40 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 24 වැනි පිටුවේ 20 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) අනුමත ගණකාධිකාරිවරයකු ඇතුළුව යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා බදු වාර්තාවක් හෝ බදු වාර්තාවක කොටසක් සකස් කරනු ලැබූ අවස්ථාවක දී එම තැනැත්තා විසින් එම බදු වාර්තාව සකස් කිරීමේ දී ඔහු සම්බන්ධ වූ ප්‍රමාණය නිශ්චිතව දක්වමින් වෙන් වෙන් වශයෙන් සහතික කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් පරීක්ෂා කරන ලද ලේඛන සහ ඔහු විසින් පාදක කරගත් තොරතුරු නිශ්චිතව දැක්විය යුතු ය. එම සහතික කිරීම බදු වාර්තාව සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී සහතික කිරීම එකී බදු වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය." ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

41 වැනි වගන්තිය සභා සම්මත විය.

42 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 25 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය සහ ඒ තීරණය සඳහා හේතු බදු ගෙවන්නා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

43 වැනි වගන්තියේ සිට 46 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

47 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 28 වැනි පිටුවේ 8 වැනි පේළියේ සිට 34 වැනි පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වංචනික ලෙස සකස් කරන ලද හෝ සහතික කරන ලද ලේඛන සඳහා වන දණ්ඩන විධිවිධාන

190අ. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා වන-

(අ) යම් ලේඛනයක් හෝ තොරතුරක් වංචනිකව සකස් කරනු ලබන; හෝ

(ආ) ලේඛනයක් වංචනිකව සහතික කරනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී, රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.".";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 29 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

48 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 31 වැනි පිටුවේ 6 වැනි පේළියේ සිට 11 වැනි පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(6) ඒ වගන්තියේ ''සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය'' යන යෙදුමේ අර්ථ නිරූපනයේ-
>
> (අ) ඒ අර්ථ නිරූපනයේ (ආ) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-
>
> ''(ආ) (ඇ) වන ඡේදයට යටත්ව, ඒ තැනැත්තාට අස්ථිත්වයක් වන ආශ්‍රිතයකු නොමැති වීම;'';
>
> (ආ) ඒ අර්ථ නිරූපනයේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-
>
> ''(ඇ) එම තැනැත්තාගේ හෝ ඔහුගේ ආශ්‍රිතයා අස්ථිත්වයක් හෝ අස්ථිත්වයන් වන්නේ නම් එම ආශ්‍රිතයාගේ සමස්ත වාර්ෂික දළ පිරිවැටුම රු. 500,000,000 කට අඩු වීම;'';'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

49 වැනි වගන්තිය සහ 50 වැනි වගන්තිය සභා සම්මත විය.

51 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 36 වැනි පිටුවේ 6 වැනි පේළියේ සිට 10 වැනි පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''ද, යම් පුද්ගලයකුගේ පහත දැක්වෙන ලැබීම් සහ ලාභ මත 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 14% ක උපරිම අනුප්‍රමාණය අනුව බදු අය කරනු ලැබිය යුතු ය:-
>
> (අ) මැණික් සහ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාව;
>
> (ආ) යම් පුද්ගලයකු විසින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කරමින් නිපදවන ලද විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සැපයීම මත ලැබුණු මුදල් ප්‍රමාණ.'';'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 39 වැනි පිටුවේ 27 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ඕ) 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, සමාගමක් විසින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කරමින් නිපදවන ලද විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සැපයීමෙන් ලබන ලැබීම් සහ ලාභ—14%;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 42 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 9 වැනි දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) ඒ ඡේදයේ (3) වන උපඡේදයේ "28%ක් විය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28%ක් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24%ක් විය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

52 වැනි වගන්තියේ සිට 54 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

55 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 58 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"එසේ වුවද, මේ උපඡේදය යටතේ වූ අඩු කිරීම තක්සේරු වර්ෂයේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 59 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යුතු අතර, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් වන ලැබීම්වලින්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

56 වැනි වගන්තියේ සිට 61 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

"අ" වගුව

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 66 වැනි පිටුවේ "අ" වගුවේ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“51(4)(ඇ)	පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2අ) උපඡේදයේ (ඔ), (ඕ) සහ (ඕඕ) යන අයිතම”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගුව සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“ආ” වගුව

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 68 වැනි පිටුවේ “ආ” වගුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“26	83	01.01.2020”

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 70 වැනි පිටුවේ “ආ” වගුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“51(4)(ඇ)	පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2අ) වන උපඡේදය ((ඔ), (ඕ) සහ (ඕඕ) යන අයිතම හැර)	01.01.2020”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 71 වැනි පිටුවේ “ආ” වගුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“56(4)	හයවන උපලේඛනයේ 4 වන ඡේදය	01.03.2020”

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගුව සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

“ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය''යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

13. කල් තැබීම (කොවිඩ් පාලනය සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් හා ඒකාබද්ධ වැඩසටහනක්): ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

(පූ. භා. 11.19 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

''ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය ''යි සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.08 ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

''ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය''යි ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.01 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.31 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව , 2021 මැයි 05 බදාදා පූ.භා 10.00 වනතෙක් කල් ගියේය.